# THE INTERNET AND THE ELECTRONIC MAIL

# (Part-II)

# සන්නිවේදනය සඳහා අන්තර්ජාලය භාවිතය

## විද්‍යුත් තැපෑල

පුද්ගලයන් දෙදෙනෙකු හෝ සමූහයක් හෝ අතර විද්‍යුත් ක්‍රමයට ලිපි හා ලිපි ගොනු ලෙස පණිවුඩ හුවමාරු කිරීම විද්‍යුත් තැපෑල මගින් සිදුවේ.

### විද්‍යුත් තැපැල් ලිපිනයක ඇති කොටස්

exams@doenets.lk

පරිශීලක නාමය (User name) — වසම් නාමය (Domain name)

ClassWork.LK

## විද්‍යුත් තැපැල් ලිපියක් යැවීම

**To** → යන ස්ථානයේ ලබන්නාගේ විද්‍යුත් තැපැල් ලිපිනය

**Cc (Carbon copy)** → විද්‍යුත් තැපැල් පණිවිඩයේ පිටපත් යැවිය යුතු අයගේ විද්‍යුත් තැපැල් ලිපිනය

**Bcc (Blind carbon copy)**→ විද්‍යුත් ලිපිය ලැබෙන To සහ Cc යටතේ සඳහන් අයට නොදැනෙන ලෙස යැවිය යුතු අයගේ විද්‍යුත් තැපැල් ලිපිනය

## විද්‍යුත් තැපැල් ගිණුමක ඇති ලිපි වර්ග

- Inbox - ලැබෙන ලිපි තැන්පත් කිරීමට
- Drafts - යැවීමට සකස් කළ නමුත් සම්පූර්ණ කර ගත නොහැකි වූ ලිපි තැන්පත් කිරීමට
- Sent - යවන ලද ලිපි තැන්පත් කිරීමට
- Trash/Deleted - මකාදමන ලද ලිපි යම් කාලයක් රැඳවා තබා ගැනීමට
- Spam/Junk - ආයාචිත (අනවශ්‍ය) ලිපි රැඳවා ගැනීමට

ClassWork.LK

## ක්ෂණික පණිවිඩ යැවීම (Instant Messaging - IM)

අන්තර්ජාලය හරහා දෙදෙනකු අතර පෞද්ගලික ව සරල කෙටි පාඨ යොදා ගනිමින් සැණෙකින් අදහස් හුවමාරු කර ගැනීම ක්ෂණික පණිවිඩ යැවීමයි.

## වීඩියෝ සම්මන්ත්‍රණ (Vedio conferencing)

වීඩියෝ සම්මන්ත්‍රණයක් යනු දුරස් ස්ථානවල සිටින දෙදෙනෙක් හෝ වැඩි පිරිසක් හෝ අතර ශ්‍රව්‍ය හා දෘශ්‍ය දත්ත සම්ප්‍රේෂණය කරමින් පරිගණක ජාල ඇසුරෙන් සංවාදයක් පැවැත්වීම වේ.

### වීඩියෝ සම්මන්ත්‍රණයක් පැවැත්වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා

- පරිගණක
- වෙබ් කැමරා
- අන්තර්ජාල සම්බන්ධතාව
- සන්නිවේදන මෘදුකාංග

ClassWork.LK

## සමාජීය ජාල

සමාජීය ජාල යනු පුද්ගලයන් අන්තර්ජාලය ඔස්සේ සමාජ සබඳතා පවත්වාගෙන යෑමේ ක්‍රමවේදයකි.

## වලාකුළු පරිගණක සංකල්පය (Cloud Computing)

පෞද්ගලික පරිගණක ඇතුළු සියලු පරිගණක ජාල සහ ජංගම මෙවලම් රැහැන් රහිත අන්තර්ජාල සම්බන්ධතා ඔස්සේ අවශ්‍ය ඕනෑ ම මොහොතක, ඕනෑ ම තැනක සිට තොරතුරු ලබා ගැනීමට හා තැන්පත් කිරීමට පහසුකම් සලසන ක්‍රමය වලාකුළු පරිගණක සංකල්පය ලෙස හැඳින්වේ.

**වලාකුළු පරිගණකය මගින් ඉටු කෙරෙන ප්‍රධාන සේවා**

- යටිතල පහසුකම් සේවාවක් ලෙස (Infrastructure as a Service)-IaaS
- සංවර්ධන පරිසර සේවාවක් ලෙස (Platform as a Service)-PaaS
- මෘදුකාංග සේවාවක් ලෙස (Software as a Service)-SaaS

ClassWork.LK

# වලාකුළු පරිගණක භාවිතයේ වාසි අවාසි

| වාසි | අවාසි |
| --- | --- |
| මෘදුකාංග සඳහා යන වියදම අඩුවීම. | නොකඩවා පවතින අන්තර්ජාල පහසුකම් අවශ්‍ය වීම. |
| කාර්ය සාධනය වැඩි දියුණු වීම. | අඩු වේග සම්බන්ධතා වලදී ක්‍රියාකාරිත්වය අඩුවීම. |
| නඩත්තු ගැටලු අවම වීම. | |
| මෘදුකාංග ක්ෂණික ව යාවත්කාලීන කිරීම. | |

ClassWork.LK

ClassWork.LK